අ.පො.ස. සාමාන්‍ය පෙළ

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# Business and Accounting Studies

සැකසුම හා ඉදිරිපත් කිරීම:-


## ධම්මික හෙට්ටිආරච්චි

රජයේ පිළිතුරු පත්‍ර පරීක්ෂක,

Teacher of st.peter's college

077 6530215

# 01.ව්‍යාපාර පසුබිම



## අන්තර්ගතය

1.1 ව්‍යාපාර පිළිබඳ මූලික පදනම

- ★ ව්‍යාපාර සංකල්පය
- ★ ව්‍යාපාර අරමුණු හා පරමාර්ථ
- ★ පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
- ★ භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
- ★ සේවා නිෂ්පාදන
- ★ නිෂ්පාදන සාධක

1.2 ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව

- ★ ඇල්මැති පාර්ශව
- ★ ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු.







# ව්‍යාපාර පසුබිම

අප සමාජය තුළ ජීවත් වන පුද්ගලයින් විසින් දිනපතා සපුරාගත යුතු අවශ්‍යතා රැසක් ඇත. ඒ වෙනුවෙන් බොහෝ දේ පරිභරණය කරනු ලබයි.

*උදා:-*

*පුද්ගලයෙක් උදෑසන අවදි වූ අවස්ථාවේ සිට රාත්‍රී නින්දට යන තෙක් පරිභරණය කරන දෑ වශයෙන් දත් බුරුසුව, දන්තාලේප, සබන්, බාල්දිය, තේ, උදෑසන ආහාර, ඇඳුම් පැළඳුම්, ප්‍රවාහන මාධ්‍ය, පුවත්පත්, දිවා ආහාර, රාත්‍රී ආහාර, ශිෂ්‍යයෙකු නම් පාසල් පොත් හා උපකරණ, අධ්‍යාපන ආයතන ආදිය දැක්විය හැකිය.*



මිනිසාගේ අවශ්‍යතා සපුරාලීමට යොදාගනු ලබන සියලු දෑ, භාණ්ඩ හා සේවා ලෙස හඳුන්වමු.

වර්තමාන සමාජය තුළ මිනිසාට අවශ්‍ය භාණ්ඩ හා සේවා වලින් බොහාමයක් සපයනු ලබන්නේ ව්‍යාපාර විසිනි. නවීන සංකීර්ණ සමාජය තුළ තමන්ට අවශ්‍ය සියලු දෑ නිෂ්පාදනය කිරීමට මිනිසා අපොහාසත් වීම එයට හේතුවයි.

මෙහිදී මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමෙන් ව්‍යාපාර මිනිසාගේ පැවැත්මට දායක වී ඇති අතර, තම අවශ්‍යතා සඳහා ව්‍යාපාරවලින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමෙන් ව්‍යාපාරවල පැවැත්මට මිනිසා දායක වී ඇත.



# ව්‍යාපාර පසුබිම

- **ව්‍යාපාර යන්න හඳුන්වන්න.**

  - ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.




# ❖ ව්‍යාපාර වර්ග.

ව්‍යාපාර විසින් ඉටුකරන කාර්යයේ ස්වභාවය අනුව ව්‍යාපාර පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.

i. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
ii. සේවා සැපයීමේ ව්‍යාපාර
iii. වෙළඳ ව්‍යාපාර
iv. බෙදා හැරීමේ ව්‍යාපාර



# ව්‍යාපාර යටතට අයත් විවිධ අංශ, ගැලීම් සටහනකින් ඉදිරිපත් කිරීම.



# ව්‍යාපාරයක සිදුවන ප්‍රධාන කාර්යයන්

1. නිෂ්පාදනය.
2. මිලදී ගැනීම.
3. විකිණීම.
4. ගබඩාකරණය.
5. කළමණාකරණය හා පරිපාලනය.
6. සන්නිවේදනය.





# ව්‍යාපාර අරමුණු



"සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ කිසියම් සුවිශේෂී අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටුකරගැනීමේ අපේක්ෂාවෙනි"

## අරමුණක් යනු කුමක්ද?

සාමාන්‍යයෙන් අරමුණු යනු දිගුකාලීනව ලබාකරගැනීමට අපේක්ෂා කරන ප්‍රතිඵලයකි.
ව්‍යාපාරයකට අරමුණු එකක් හෝ කීපයක් පැවතිය හැකිය.

## පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු

- ✓ ලාභ ඉපයීම
- ✓ පාරිභෝගික තෘප්තිය ඉහල නැංවීම



## ව්‍යාපාරික අරමුණු ඉටුකරගැනීමේදී ව්‍යාපාරයක් ඉටුකරගත යුතු උප අරමුණු. (ඉලක්ක)

- භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහල නැංවීම.
- රැකියා උත්පාදනය
- සේවක සුභසාධනය

## ව්‍යාපාරවල ඓතිහාසික විකාශනයේ ප්‍රධාන අදියරයන්.

- භාණ්ඩ හුවමාරු ක්‍රමය ක්‍රියාත්මක වීම
- මුදල් භාවිතයට පැමිණීම
- තාක්ෂණික යෙදවුම් භාවිතය (කාර්මික විප්ලවය)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව



# නූතන ලෝකයේ ව්‍යාපාර කටයුතු වර්ධනය වීමට ඉවහල් වූ සාධක

1) මහා පරිමාණ නිෂ්පාදනය
2) තාක්ෂනයයේ දියුණුව
3) උපකාරක සේවාවන්ගේ දියුණුව
4) තරගකාරිත්වය
5) විවෘත ආර්ථික ප්‍රතිපත්ති
6) ජගත්කරණය හෙවත් ගෝලීය කරණය



# පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා



**"ව්‍යාපාරවල පදනම ඇතිවන්නේ අවශ්‍යතා හා වුවමනා තුළිනි."**

- **අවශ්‍යතා** - needs

ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ මිනිස් අවශ්‍යතා ලෙස හඳුන්වයි.



## අවශ්‍යතා මූලික කොටස් දෙකකි.

### (අ) මූලික මිනිස් අවශ්‍යතා

මේවා ජීවත්වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ වේ




උදා:- i) ආහාර



ii) ඇඳුම්



iii) නිවාස





## (ආ) සමාජයීය මිනිස් අවශ්‍යතා

සමාජ සංවර්ධනයත් සමග හඳුනාගත් මූලික මිනිස් අවශ්‍යතා ඉටුවීමෙන් අනතුරුව පෙළගැසෙන සෙසු අවශ්‍යතා, මේ ගණයට අයත් වේ.

උදා:- අධ්‍යාපනය
සෞඛ්‍යය
ආරක්ෂාව
ප්‍රවාහනය
විනෝදය



## ➢ අවශ්‍යතාවල ලක්ෂණ.

1. අත්‍යවශ්‍ය වීම
2. පොදු වීම
3. නිර්මාණය කළ නොහැකිවීම.
4. සීමිත වීම
5. ප්‍රාථමික වීම.



## ❖ වුවමනා - Wants

මිනිස් අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැදින්වේ.



# වුවමනා සඳහා නිදසුන්

**අවශ්‍යතා** **වුවමනා**

★ **ආහාර** - බත්,පාන්,ඉදි ආප්ප,කේක්, බිස්කට්,පළතුරු

★ **ඇඳුම්** - සාරි,කමිස,ගවුම්,නිළ ඇඳුම්,පාවහන්

★ **නිවාස** - පැල්පත්,නේවාසිකාගාර,මන්දිර,මහල් නිවාස



## ➢ වුවමනාවල ලක්ෂණ..

- අත්‍යවශ්‍ය නොවීම.
- විවිධ වීම.
- නිර්මාණය කළ හැකිවීම.
- සංකීර්ණ වීම.
- අසීමිත වීම.



# පහත දැක්වෙන අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර දක්වන්න.

| අවශ්‍යතාව | වුවමනා |
|---|---|
| 1. ආහාර | බත් ,පාන් ,ආප්ප ,ඉදිඅප්ප ,පිට්ටු ,රොටී ,අඹ ,බිස්කට් ,සිසිල්බීම . |
| 2. ඇඳුම් පැළඳුම් | කමිස ,කලිසම් ,ගවුම් ,සාරි ,පාවහන් ,අත් ඔරලෝසු |
| 3. වාසස්ථාන | පැල්පත් ,ගල් ගුහා ,මන්දිර ,නේවාසිකාගාර ,මහල් නිවාස ,ඉග්ලු ගෙවල් |
| 4. අධ්‍යාපනය | පොත් පත් ,පාසල් ,ගුරුවරු , අන්තර්ජාලය ,පුස්තකාල |
| 5. සෞඛ්‍යය | බෙහෙත්,රෝහල්,වෛද්‍යවරු, ව්‍යායාම |
| 6. ආරක්ෂාව | දෙමව්පියන්, ආරක්ෂක සේවා, CCTV කැමරා |
| 7. ප්‍රවාහනය | මහාමාගර්, අධිවේගී මාගර්, බස්රථ, පාලම්, දුම්රිය |
| 8. සන්නිවේදනය | දුරකථන, අන්තර්ජාලය , කෙටි පණිවුඩ, පුවත්පත් |
| 9. විනෝදය | ක්‍රීඩා තරඟ, සංගීත සංදර්ශන, චිත්‍ර පට, නාට්‍ය |
| 10. ආදරය | දෙමව්පියන්, ගුරුවරුන්, සහෝදරයින්, සුරතල් සතුන් |



# අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම්.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| 1. සීමිතයි | 1. අසීමිතයි |
| 2. අත්‍යාවශ්‍ය වීම. | 2. අත්‍යාවශ්‍ය නොවීම. |
| 3. පොදු වීම. | 3. විවිධ වීම. |
| 4. නිර්මාණය කළ නොහැකි වීම | 4. නිර්මාණය කළ හැකි වීම. |
| 5. ප්‍රාථමික වීම. | 5. ද්විතීයික වීම. |



## මිනිස් වුවමනා තීරණය කරන සාධක.

- රැකියාව
- ජනවාර්ගික වෙනස්කම්
- වයස
- ස්ත්‍රී, පුරුෂ භාවය
- ජීවත්වන ප්‍රදේශය
- සංස්කෘතිය



# නිෂ්පාදිත - Product



**නිෂ්පාදිත යන්න හඳුන්වන්න.**

- අවශ්‍යතා තුළින් මතුවන වුවමනාවන් තෘප්තිමත් කිරීමට විවිධ දෑ යොදාගැනේ.මේවා නිෂ්පාදිත ලෙස හැඳින් වේ.

**නිෂ්පාදිත වර්ගකර දක්වන්න.**

- ✓ භාණ්ඩ
- ✓ සේවා
- ✓ අදහස්

} සේවා



# භාණ්ඩ – Physical goods



- ✓ මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ස්පශර්කළ හැකි භෞතික පැවැත්මක් ඇති දෑ භාණ්ඩ ලෙස හඳුන්වනු ලබයි.

## භාණ්ඩ සඳහා නිදසුන්

සකස් කළ අහාර පාන -




මෝටර් රථ -



විදුලි උඳුන් -



ජංගම දුරකථන -



රෙදි සෝදන යන්ත්‍ර -



ගෘහ භාණ්ඩ -



පොත් පත් -



පාවහන් -



# භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණ

- ස්පර්ශ කළ හැකිවීම.
- නිෂ්පාදනය හා පරිභෝජනය එකම අවස්ථාවේ සිදුනොවේ.
- භෞතික දෙයක් නිසා පුද්ගලයාගෙන් වෙන්කළ හැකිය.
- භාණ්ඩවල ඒකීය බවක් හෙවත් සමාන බවක් ඇත.
- ගබඩා කර පසුව ප්‍රයෝජනයට ගත හැකිය.

## සේවා - Services

ව්‍යාපාරයක් විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ක්‍රියාවක් **හෝ** ක්‍රියාවලියක් සේවා ලෙස හැඳින්විය හැකිය.



# සේවා සඳහා නිදසුන්

✵උපකාරක සේවා - බැංකු සේවා,රක්ෂණ සේවා,සන්නිවේදන සේවා,ප්‍රවාහන සේවා










## වෘත්තීමය සේවා - ගණකාධිකාරී,නීතිඥ ,ගුරු, වෛද්‍ය







## සංචාරක සේවා - හෝටල්,ආපනශාලා








## විවිධ අලුත් වැඩියා කිරීමේ කටයුතු







## සේවාවල දැකිය හැකි ලක්ෂණ

- ස්පශර්කළ නොහැකි වීම.
- සපයන්නාගෙන් සපයන සේවය වෙන් කළ නොහැකි වීම.
- අනාගත පරිභෝජනය සඳහා ගබඩා කර තැබිය නොහැකි වීම.
- නිෂ්පාදනය සහ පරිභෝජනය යන දෙකම එකම අවස්ථාවේදී සිදුවීම.
- සේවා විවිධ වීම - පුද්ගලයා,කාලය,ස්ථානය යනාදිය මත



# භාණ්ඩ හා සේවා අතර වෙනස්කම්

| භාණ්ඩ | සේවා |
|---|---|
| 01. ස්පර්ශ කල හැකි වීම. | 01. ස්පර්ශ කළ නොහැකි වීම. |
| 02.ගබඩාකර පසුව පසුව ප්‍රයෝජනයට ගත හැකි වීම. | 02. ගබඩා කළ නොහැකි වීම. |
| 03. ඒකීය බවක් පැවතීම | 03. සේවා විවිධ වීම. |
| 04. සපයන්නාගෙන් වෙන්කළ හැක. | 04. සපයන්නාගෙන් වෙන්කළ නොහැක. |
| 05.නිෂ්පාදනය සහ පරිභෝජනය එකම අවස්ථාවේදී සිදු නොවේ. | 05. නිෂ්පාදනය හා පාරිභෝජනය එකම අවස්ථාවේදී සිදුවේ. |



# නිෂ්පාදන ව්‍යාපාර වර්ග

**නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර පහත සඳහන් ලෙස වර්ගකර දැක්විය හැකිය.**

- භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
- සේවා නිෂ්පාදන ව්‍යාපාර

## භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර

✓ මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.

## භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර සඳහා නිදසුන්

- ටයර් නිෂ්පාදන ආයතනයක්.
- බේකරියක්.
- ඇඟලුම් කම්හලක්.
- මෝටර් රථ නිෂ්පාදන ආයතනයක්.
- ගෘහ භාණ්ඩ නිපදවන ආයතනයක්.
- පාවහන් නිපදවන ආයතනයක්.











# සේවා සැපයීමේ ව්‍යාපාර

- පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් ඉටුකරන ආයතන සේවා නිෂ්පාදන ව්‍යාපාර වේ.

# සේවා සැපයීමේ ව්‍යාපාර සඳහා නිදසුන්

- තොග වෙළඳ ආයතන.
- සිල්ලර වෙළඳ ආයතන.
- රක්ෂණ ආයතන.
- බැංකු ආයතන.
- රූපලාවන්‍ය ආයතන.
- අධ්‍යාපන ආයතන.
- තැපැල් කාර්යාල.
- රෝහල්.
- ගරාජ.
- බාබර් සාප්පු.













# සන්නම් නාමයක් යනු කුමක්ද?

✓ කිසියම් නිෂ්පාදකයකුගේ නිෂ්පාදිත වලින් වෙන් කර හඳුනාගැනීම සඳහා භාවිතා කරන නම සන්නම් නාමයක් ලෙස හඳුන්වයි

**නිදසුන් :-**

- සන්ලයිට්
- ලයිෆ්බෝයි
- සිග්නල්
- ක්ලෝගාඩ්
- සිරස
- දෙරණ
- යමහා
- හොන්ඩා









## **පාරිභෝගිකයන් විවිධ සන්නම් නාම යටතේ භාණ්ඩ තෝරාගැනීමට හේතු.**

- මිලගණන් අඩුවීම.(ආදායම් මට්ටම)
- ගෙවන මිලට උපරිම තෘප්තියක් ලැබීම. (පාරිභෝගික රුචිකත්වය)
- ගුණාත්මක වීම.
- සමාජ තත්ත්වය.





# නිෂ්පාදන සාධක

## නිෂ්පාදන සාධක යනු මොනවාද?

❖ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාරවලට විවිධ සම්පත් අවශ්‍ය වේ.මෙසේ අවශ්‍ය වන සම්පත් නිෂ්පාදන සාධක ලෙස හැදින්වේ.

## නිෂ්පාදන සාධක වර්ග කර දක්වන්න.

- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසාය



# එක් එක් නිෂ්පාදන සාධක සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.



**භූමිය** – ඉඩම්, ඛනිජ සම්පත්, වන සම්පත්,පස්,වාතාශ්‍රය, ආලෝකය.

**ශ්‍රමය** –පතල් සේවකයෝ, සනීපාරක්ෂක කම්කරුවෝ,කළමණාකරුවෝ.

**ප්‍රාග්ධනය** – යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, රථවාහන, මුදල්.

**ව්‍යවසාය** – අයිතකරුවන්, සංවිධායකයින්.

# නිෂ්පාදන සාධක වෙනුවෙන් කරන ගෙවීම්.



| | | |
|---|---|---|
| භූමිය | – | බදු කුලී |
| ශ්‍රමය | – | වැටුප් |
| ප්‍රාග්ධනය | – | පොලී |
| ව්‍යවසාය | – | ලාභ |



# ව්‍යාපාර විසින් ඉටුකරන ව්‍යවසායකත්ව කාර්යයන්.

- නව්‍යතා සම්පාදනය.
- අවදානම් දැරීම.
- තීරණ ගැනීම.



# ඇල්මැති පාර්ශව



**ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව හඳුන්වන්න.**

**ව්‍යාපාර කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මති පාර්ශව ලෙස හැදින්වේ.**



# ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව නම්කරන්න.

- අයිතිකරු/අයිතිකරුවන්
- මූල්‍ය ආයතන
- කළමනාකරුවන්
- ගනුදෙනුකරුවෝ /පාරිභෝගිකයෝ
- සේවකයෝ
- රජය
- සැපයුම්කරුවෝ
- ප්‍රජාව
- තරඟකරුවෝ




පහත දැක්වෙන ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන් ව්‍යාපාර තුළින් ඉටුකරගැනීමට අපේක්ෂා කරන අරමුණු සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

| ඇල්මැති පාර්ශ්ව | අරමුණු සඳහා නිදසුන් |
| --- | --- |
| 1. අයිතිකරුවෝ | • ආයෝජනයේ සුරක්ෂිතතාව.<br>• ප්‍රමාණවත් ලාභයක් ලැබීම.<br>• ව්‍යාපාරයේ අනාගත වර්ධනය. |
| 2.කළමනාකරුවෝ | • කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීමට.<br>• කලාමනාකරණ කටයුතුවල සාර්ථකත්වය මැනීමට.<br>• රැකියා වර්ධනය රැකියා තෘප්තිය. |
| 3. සේවකයෝ | • රැකියාවේ සුරක්ෂිත බව දැනගැනීමට.<br>• සාධාරන වැටුපක් ලබාගැනීමට හැකිද යන්න.<br>• ලබා ගත හැකි වෙනත් ප්‍රතිලාභ ලබාගැනීමට. |
| 4. ගනුදෙනුකරුවෝ | • ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීමට.<br>• නිෂ්පාදිත සාධාරන මිලකට ලබාගැනීමට.<br>• ඉතා ඉක්මනින් හා පහසුවෙන් භාණ්ඩ හා සේවා ලබා ගත හැකිද යන්න. |



| | |
|---|---|
| 5.සැපයුම්කරුවෝ | • අඛණ්ඩව ඇනවුම් ලබා ගැනීම.<br>• නිසි පරිදි මුදල් ලබා ගැනීම. |
| 6.ණයදෙන අයතන | • දෙන ලද ණය අය කර ගැනීම<br>• තව දුරටත් ණය සැපයීම |
| 7.රජය | • ලැබිය යුතු බදු ආදායම නිසි ලෙස ලබාගැනීම<br>• පාරිභෝගිකයන් සුරක්ෂිත වන ලෙස ව්‍යාපාරය පවත්වා ගන්නේද<br>• ජාතික නිෂ්පාදිතය වධර්නය කරගැනීම |
| 8.තරඟකරුවෝ | • තම නිෂ්පදිතවල මිල තීරණය කිරීම.<br>• තරඟයට මුහුණ දීම. |
| 9.ප්‍රජාව | • පරිසරයට හිතකරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේදැයි විමසා බැලීම.<br>• සමාජ සුභසාධනයට දායක වන්නේදැයි විමසා බැලීම. |
| 10.මාධ්‍යවේදීන් | ව්‍යාපාර තොරතුරු |



# ඇල්මැති පාර්ශ්ව මගින් ව්‍යාපාර අපේක්ෂක දායකත්වය.

| ඇල්මැති පාර්ශ්ව | දායකත්වය සඳහා නිදසුන් |
|---|---|
| 1. අයිතිකරුවෝ | ○ ප්‍රමාණවත් ප්‍රාග්ධන දායකත්වයක් ලබාදීම.<br>○ ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුව හා කැපවීම. |
| 2.කළමනාකරුවෝ | ○ ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.<br>○ නිවැරදි තීරණ ගැනීම. |
| 3. සේවකයෝ | ○ පවරන ලද කාර්යය නිසි ලෙස ඉටුකිරීම.<br>○ ශ්‍රම පලදායිතාව වැඩි කිරීම. |
| 4. සැපයුම්කරුවෝ | ○ ගුණාත්මක අමුද්‍රව්‍ය දිගින් දිගටම සැපයීම.<br>○ කලට වෙලාවට අමුද්‍රව්‍ය සැපයීම. |
| 5. රජය | ○ ව්‍යාපාර සඳහා හිතකර දිරිගැන්වීම් ලබාදීම. |



# අභ්‍යාස

01. ඔබ දිනකට පරිභෝජනය කරන විවිධ භාණ්ඩ කිහිපයක් නම්කොට, එම භාණ්ඩවල නිෂ්පාදිත රට, ඒ ඒ භාණ්ඩ ඉදිරියෙන් සඳහන් කරන්න.

02. භාණ්ඩ හුවමාරු ක්‍රමය (Bartar System) හඳුන්වන්න.

03. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පදනම කුමක්ද?

04. වර්තමානයේ මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්වී ඇත. ඒ සඳහා බලපෑ හේතුව කුමක්ද?

05. සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ යම් සුවිශේෂී අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටුකරගැනීමේ අපේක්ෂාවෙනි. එයට බලපෑ හේතුව කුමක්ද?

06. ව්‍යාපාරයක් විසින් සේවක සුභසාධනය වෙනුවෙන් ලබාදෙන පහසුකම් හතරක් සඳහන් කරන්න.





07. <u>පහත සඳහන් භාණ්ඩ හා සේවා ලැයිස්තුව උපයෝගී කරගෙන වගුව සම්පූර්ණ කරන්න.</u>

නූඩ්ල්ස්, සිසිල්බීම, ටී-ෂර්ට්, සෞඛ්‍ය, සපත්තු, ගල්ගුහා, තට්ටු නිවාස, නේවාසිකාගාර, ආරෝග්‍යශාලා පහසුකම්, බිස්කට්, අඹ, දොඩම්, පවිත්‍රතාව, ආහාර, සාරි, නිවාස, කොස්, ආභරණ, විශේෂඥ වෛද්‍ය සේවා, ඇඳුම්

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| | |



08. යා කර පෙන්වන්න.

| | |
|---|---|
| | අත් ඔරලෝසු |
| ආහාර | කිරි |
| | ඇස්කන්නාඩි |
| අධ්‍යාපනය | මන්දිර |
| | චොකලට් |
| ඇඳුම් | විෂබීජ නාශක |
| | කමිස |
| නිවාස | පොත්පත් |
| | ගුරු සේවය |
| | වෛද්‍ය සේවය |
| සෞඛ්‍යය | පාන් |



09. අතීතයේදී හා වර්තමානයේදී මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමේදී විවිධ භාණ්ඩ හා සේවා යොදාගැනීම පිළිබඳව සැසඳීමක් කරන්න.

10. ඔබේ නිවසේ එදිනෙදා පරිභෝජනයට ගන්නා භාණ්ඩ රාශියක් ඇත. මේවායින් ඔබ ප්‍රදේශයේ නිපදවන භාණ්ඩ මොනවාද යන්න නම්කරන්න.

11. පහත දක්වෙන ව්‍යාපාර, භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර, සේවා සැපයීමේ ව්‍යාපාර යටතේ වර්ග කර දක්වන්න.

- ⋆ බේකරියක්
- ⋆ බාබර් සාප්පුවක්
- ⋆ ටයර් නිෂ්පාදන ආයතනයක්
- ⋆ සිල්ලර වෙළඳ ව්‍යාපාරයක්
- ⋆ වී මෝලක්
- ⋆ බැංකුවක්
- ⋆ ප්‍රවාහන සේවා සපයන ආයතනයක්
- ⋆ ඇඟළුම් කම්හලක්
- ⋆ අධ්‍යාපන ආයතනයක්
- ⋆ ගෘහභාණ්ඩ නිෂ්පාදන ආයතනයක්





12. එකම අවශ්‍යතාව සඳහා විවිධ සන්නාම් නාමවලින් යුත් භාණ්ඩ වෙළඳපොළට ඉදිරිපත් කරනු දැකිය හැකිය. පහත එක් එක් භාණ්ඩ වර්ගය සඳහා ඔබ නිවසේ පරිභෝජනය කරනුයේ කුමන සන්නාම් නාමයකින් හැඳින්වෙන භාණ්ඩදැයි දක්වා ඒවා තෝරාගැනීමට හේතු වූ කරුණු, ඉදිරියෙන් සඳහන් කරන්න.

| භාණ්ඩ වර්ගය | සන්නාම් නාමය | තෝරාගැනීමට හේතු |
|---|---|---|
| සබන් | | |
| දන්තාලේප | | |
| චොකලට් | | |
| අභ්‍යාස පොත් | | |
| පෑන් | | |

13. ඔබ ප්‍රදේශයේ පවතින සේවා නිෂ්පාදන ව්‍යාපාර නම්කර, ඒවා මගින් සැපයෙන සේවා මොනවාද යන්න සඳහන් කරන්න.

14. ඉඩම්, යන්ත්‍ර, ගොඩනැගිලි, මුදල්, අයිතිකරුවන්, සේවකයින්, වාතාශ්‍රය, ආලෝකය, පස, ජලය, වනාන්තර, ඛණිජ, කළමනාකරුවන්, මෙවලම් යන ව්‍යාපාර පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් නිෂ්පාදන සාධක යටතේ වෙන්කර දක්වන්න.

15. i. ඔබ ප්‍රදේශයේ පවත්නා ව්‍යාපාරයක් තෝරාගෙන, එම ව්‍යාපාරය භාවිතා කරන විවිධ සම්පත් ලැයිස්තුගත කරන්න.

ii. ඔබ විසින් හඳුනාගත් සම්පත්; භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය යන සාධක යටතේ වර්ගකරන්න.

iii. එම ව්‍යාපාර ඉටුකරන ව්‍යවසායකත්ව කාර්යයන් සඳහන් කරන්න.



16. යා කර දක්වන්න.

| ඇල්මැති පාර්ශ්වය | අරමුණු |
|---|---|
| 1. අයිතිකරු | ★ තරගයට මුහුණදීම |
| 2. කළමනාකරුවන් | ★ දෙන ලද ණය අයකර ගැනීම |
| 3. සේවකයෝ | ★ ආයෝජනයේ සුරක්ෂිතතාවය |
| 4. ගනුදෙනුකරුවෝ | ★ නිෂ්පාදිත සාධාරණ මිලට ලබාගැනීම |
| 5. සැපයුම්කරුවෝ | ★ කළමනාකරණ කටයුතුවල සාර්ථකත්වය දැනගැනීම |
| 6. ණයදෙන ආයතන | ★ රැකියා සුරක්ෂිත බව |
| 7. රජය | ★ අඛණ්ඩ ඇණවුම් ලබාගැනීම |
| 8. තරගකරුවෝ | ★ ලැබිය යුතු බදු ආදායම් නිසි ලෙස ලබාගැනීම |
| 9. ප්‍රජාව | ★ සමාජයට ව්‍යාපාරයෙන් වන සේවාව පිළිබඳව අවධානය යොමුකිරීම |

17. ඔබගේ පාසලට සම්බන්ධ ඇල්මැති පාර්ශ්ව නම්කරන්න. ඔවුන් පාසලෙන් ඉටුකරගැනීමට බලාපොරොත්තු වන අරමුණු හා පාසල ඔවුන්ගෙන් අපේක්ෂිත දායකත්වය වගුගත කරන්න.

18. ඔබ ප්‍රදේශයේ ව්‍යාපාර කටයුතු කරන පහත දැක්වෙන ආයතනවල ඇල්මැති පාර්ශව හඳුනාගෙන සටහන් කරන්න.

★ වාණිජ බැංකුවක් ★ කර්මාන්තශාලාවක්



19. රෝහලක, වෙළඳසැලක ඇල්මැති පාර්ශ්ව නම්කර, ඔවුන්ගේ ඊට අදාළ අරමුණු පෙළගස්වන්න.

20. පහත සඳහන් පද නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

i. සෘජු නිෂ්පාදනය ii. වක්‍ර නිෂ්පාදනය

